Monash Health

# වීඩියෝ ඇමතුමක් ඔස්සේ ඔබගේ හමුවීමට සහභාගී වීම

healthdirect Video Call

**සුදුසු අවස්ථාවල දී, ඔබට වීඩියෝ ඇමතුමක් ඔස්සේ මාර්ගගතව ඔබේ උපදේශනය සිදු කළහැකිය.**

වීඩියෝ ඇමතුම්, දුරකථන ඇමතුමක් තරම්ම පහසු වන අතර, මුහුණට මුහුණ සන්නිවේදනය කළ හැකි නිසා අමතර වටිනාකමක් ද ඇත.

එමගින් ඔබේ කාලය සහ මුදල් ඉතිරි කරමින් ඔබේ රැකවරණය නිවසට සමීප කරයි.



## මගේ හමුවීමට සහභාගී වීමට මා යා යුත්තේ කොතැනටද?

**ඔබගේ හමුවීමට සහභාගී වීමට, යන්න:**

www.monashhealth.org/services/telehealth

ඔබගේ හමුවීම සඳහා ගමන් කිරීම වෙනුවට, ඔබ සායනයේ රැඳී සිටින ප්‍රදේශයට මාර්ගගතව ඇතුළු වීම මෙහිදී සිදුවේ වේ. ඔබ පැමිණි විට සෞඛ්‍ය සේවාවට දැනුම් දෙනු ලබන අතර, සූදානම් වීමෙන් අනතුරුව ඔබේ චිකිත්සකයා ඔබ හා එක්වනු ඇත. ගිණුමක් නිර්මාණය කිරීමට අවශ්‍ය නො නොවන අතරඔබ ඇතුළත් කරන කිසිදු තොරතුරක් ගබඩා නොවේ.

## වීඩියෝ ඇමතුමක් ගැනීමට මට අවශ්‍ය මොනවාද?

- **හොඳ අන්තර්ජාල සම්බන්ධතාවයක්**
  ඔබට අන්තර්ජාලයෙන් වීඩියෝවක් නැරඹිය හැකි නම් (උදා: යූ ටියුබ්), ඔබට වීඩියෝ ඇමතුමක් ලබා ගත හැකිය.
- **උපදේශනය අතරතුර ඔබට බාධාවක් නොවන පෞද්ගලික, හොඳින් ආලෝකමත් ප්‍රදේශය ක්.**
- **කලින් පිටුවේ පෙන්වා ඇති පරිදි සහය දක්වන වෙබ් බ්‍රව්සරයක මෑත අනුවාදයක්:**
  - Google Chrome, Microsoft Edge, Mozilla Firefox or Apple Safari.
- **වෙබ් කැමරාව, ස්පීකර් සහ මයික්‍රෆෝනය**
  (ලැප්ටොප් හෝ ජංගම උපාංග තුළ දැනටමත් ගොඩනගා ඇත)

## එය ආරක්ෂිතද?

වීඩියෝ ඇමතුම් ආරක්ෂිත වන අතර ; ඔබේ පෞද්ගලිකත්වය ආරක්ෂා කර ඇත. ඔබට ඔබේම පෞද්ගලික වීඩියෝ කාමරයක් ඇති අතර, එයට ඇතුළු විය හැක්කේ අවසර ලත් චිකිත්සකයන්ට පමණි.

## වීඩියෝ ඇමතුමකට කොපමණ මුදලක් වැය වේද?

වීඩියෝ ඇමතුම නොමිලේ සැපයේ (ඔබගේ අන්තර්ජාල භාවිතය හැර). කෙසේ වෙතත්, වෛද්‍ය උපදේශනයක සාමාන්‍ය වියදම් - තිබේ නම් - ඒවා තවදුරටත් අදාළ වේ.

## මම කොපමණ අන්තර්ජාල දත්ත භාවිතා කරනවාද?

වීඩියෝ උපදේශනයක් සඳහා ඔබ ඉහළ විභේදනයෙන්* යූ ටියුබ් වීඩියෝවක් නරඹන විට භාවිතා කරන දත්ත වලින් අඩකටත් වඩා අඩු ප්‍රමාණයක් භාවිතා කරයි*.

අඩු වේග අන්තර්ජාල සම්බන්ධතාවලදී හෝ ඔබ අඩු බලයකින් යුතු පරිගණකයක්, ටැබ්ලටයක් හෝ ස්මාර්ට් ජංගම දුරකතනයක් භාවිතා කරන්නේ නම් දත්ත භාවිතය අඩුය. මෙම සාධක මගින් ඇමතුමේ සමස්ත ගුණාත්මකභාවය අඩු කළ හැකිය.

ඇමතුමේ සහභාගිවන්නන් දෙදෙනෙකුට වඩා සිටින විට දත්ත භාවිතය වැඩි වේ.

* *ජංගම උපාංගයකින් එය 230 MB පමණ වන අතර, පරිගණකයකින් විනාඩි 20 ක ඇමතුමකට 450 MB පමණ වේ, එය FaceTime® හා සමාන වේ .*

**ස්මාට්ෆෝන් සහ ටැබ්ලට් භාවිතා කරන්නන්**
ඔබට හැකි නම්, නිවසේ හෝ රැකියා ස්ථානයේ Wi-Fi ජාලයකට සම්බන්ධ වීමෙන්ඔබේ ජංගම දත්ත දීමනාව භාවිතා කිරීමෙන් වැළකී සිටීමට හැකිය.

# වීඩියෝ ඇමතුමක් ලබා ගැනීමට සූදානම් වීම



පහත බ්‍රව්සර්වලින් එකක මෑත අනුවාදයක් භාවිතා කිරීමට වග බලා ගන්න:

- Google Chrome (Windows, Android, MacOS, iOS)
- Microsoft Edge (Windows, Android, MacOS, iOS)
- Mozilla Firefox (Windows, Android, iOS)
- Apple Safari (MacOS, iOS)

යන්න www.monashhealth.org/services/telehealth

1. සපයා ඇති සබැඳියේ හෝ සෞඛ්‍ය සේවා වෙබ් අඩවියේ ඇති වීඩියෝ ඇමතුමක් ආරම්භ කරන්න බොත්තම ක්ලික් කරන්න.




2. විමසූ විට නම සහ විස්තර ඇතුළත් කරන්න




3. සායනයේ මාර්ගගත රැඳී සිටීමේ ප්‍රදේශයට ඇතුළු වන්න




4. චිකිත්සකයා පැමිණ උපදේශනය සිදුවෙයි



## ! යමක් නිසි ලෙස ක්‍රියාත්මක නොවන්නේ නම් මා කුමක් කළ යුතුද?

- https://help.vcc.healthdirect.org.au/troubleshooting-guideවෙත යන්න.

## වැඩිදුර තොරතුරු

Telehealth Support Contact Tel: +61 3 8572 3823
Email : telehealth@monashhealth.org